**ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**නිවාඩු කාලීන පාසල-2020 මාර්තු/අප්‍රේල්**

**සිංහල**

**07ශ්‍රේණිය__ප්‍රශ්නපත්‍ර 1**

I කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

- පහත සඳහන් වාක්‍ය වල ඉරි ඇඳි කොටසට ගැලපෙන පිළිතුර තෝරන්න.

1. සියාතු සීයා <u>කුකුළත් අතින් අරන්</u> අපේ නිවසට පැමිණියේය.

1. හොර රහසේම 2. කුකුළකු අරගෙන 3. ඉක්මනින්ම 4. උදෑසනින්ම

2. ඒ කතාව ඇසූ ඔහුගේ <u>ඉහේ මලක් පිපුණි</u>.

1. හිසෙහි මලක් හට ගැනීම 2. උදහසට පත් විය 3. සතුටට පත් විය 4. සිනාසෙන්නට විය

3. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.

1. විමර්ශන 2. සණ්ඨාර 3. පරිනාමය 4. ලෑදැරිය

4. මහප්‍රාණ අක්ෂරයක් අඩංගු නොවන පිළිතුර තෝරන්න.

1. අඛණ්ඩ 2. ග්‍රන්ථය 3. ශිෂ්ටාචාරය 4. අනුරාධ

5. දී ඇති පදයට සමාන අර්ථයක් නොදෙන පදයක් සහිත පද පේළිය තෝරන්න.

1. මිතුරු - සකි , මිත්‍ර , සබඳ 2. හිරු - දිනමිණ , දිවයුරු , චන්ද්‍රයා

3. අහස - අඹර , ගුවන , නුබ 4. මව - අම්මා , මාතා , ජනනී

6. කමත් භාෂාවේ එන වචනයක් නොවන්නේ

1. අඩහැරය 2. මුත්තෙට්ටුව 3. ඉපනැල්ල 4. ඉල්ලම

7. පහත පද අතුරින් අනුක්ත පදයක් නොවන්නේ

1. තොප 2. මිනිසුන් 3. කුරුල්ලෝ 4. ගායිකාවක

8. " අවුල් " යන්නට සුදුසු විරුද්ධ පදය තෝරන්න.

1. පැටලිලි සහගත 2. නිරවුල් 3. වෙනස් 4. අයහපත්

9. මිශ්‍ර ක්‍රියාවක් නොවන්නේ,

1. නටමින් 2. මිනිසුන් 3. බලමින් 4. දුවමින්

10. නාම විශේෂණයක් සහිත පදයක් නොවන්නේ,

1. වේගයෙන් දුවයි 2. නිල් අහස 3. කුරුලු කූඩුව 4. කළු කමිසය

UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

11. අකුරු කරන්නට උපදෙස් සපයන ග්‍රන්ථයක් නොවන්නේ,

1. සකස්කඩ 2. බුද්ධ ගජ්ජය 3. හිතෝපදේශය 4. සුභාෂිතය

- සුදුසු උක්ත පද යොදා හිස්තැන් පුරවන්න.

12. .................................... හොඳින් උගන්වති.

1. ගුරුවරුන් 2. ඔවුන් 3. මම 4. ගුරුවරු

13. .................................................. සරුංගලය හදයි.

1. ඔවුහු 2. මල්ලී 3. අපි 4. නුඹලා

14. ප්‍රථම පුරුෂ බහු වචන පදයක් වන්නේ,

1. නුඹලා 2. තොපි 3. අපි 4. කම්කරුවෝ

15. " ජනයා බහුල වශයෙන් වාසය කරන " යන්නට සුදුසු තනි පදය වන්නේ,

1. ජන ශූන්‍ය 2. ජනහිත 3. ජනාකීර්ණ 4. ජනබලය

16. පහත ක්‍රියා අතුරින් පූර්ව ක්‍රියාවක් නොවන්නේ,

1. බලා 2. ගොස් 3. බල බලා 4. ගායනා කර

17. සිංහල අක්ෂර මාලාවේ ඇති අල්පප්‍රාණ අක්ෂර ගණන වනුයේ ,

1. 12 කි. 2. 10 කි. 3. 14 කි. 4. 13 කි.

18. අභිගුණ්ඨික ජනයා "සත් " ලෙස හඳුන්වනුයේ ,

1. කුල්ල 2. කුළය 3. බේසම 4. හිරමනය

- පහත ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

19. අහේ ඉඳන් ..........................................................................................

20. කීරි අලින්ට ......................................................................................

( ලකුණු 1↔20 )

## II කොටස

- පළමු ප්‍රශ්නය හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

01.පහත දී ඇති මාතෘකා අතුරින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු රචනයක් ලියන්න.

1. වන අසිරිය රැක ගනිමු.
2. සාරධර්ම සපිරි සමාජයක්.
3. මත් උවදුර දුරු කරමු.
4. සාමය හා සමගියෙන් සපිරි රටක්.

UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

02. ඔබ පාසලේ ක්‍රියාත්මක පරිසර සංගමයේ ලේකම් ඔබ යැයි සිතන්න. මේ වනවිට ඔබ පළාතේ සිදු කෙරෙන වන විනාශය නතර කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා අඩවි වන නිලධාරීතුමාට යැවීමට සුදුසු ලිපිය පිළියෙල කරන්න. (ලකුණු 15)

නැතහොත්

ඔබ පාසලේ ශිෂ්‍යනායකයින් සඳහා නිල ලාංඡන පැලඳවීමේ උළෙල ඉදිරියේදී පැවැත්වීමට නියමිතව ඇත. එම උළෙල සඳහා පැමිණෙන ලෙස දන්වා ආරාධිත අමුත්තන්ට යැවීමට සුදුසු ආරාධනා පත්‍රය පිළියෙල කරන්න. (ලකුණු 15)

03. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

සෙනසුරාදාත් ඉරිදාත් සෙල්ලමින් කාලය ගෙවන බැවින් ඒ දෙදවස තුළ පාඩම් කිරීම අතපසු කළේ මා පමණක් නොවේ. අපගේ පන්තියේ ළමයින් තුන් හතර දෙනෙකු හැර අනෙක් සියලු දෙනාම , සඳුදා පාඩමෙහි දුර්වලත්වයක් පෑයේ නිවාඩු දෙදවස සෙල්ලමින් ගෙවූ නිසාය. ඉගෙනීමෙහි සමර්ථ තුන් හතර දෙනාද , නිවාඩු දෙදවස සෙල්ලමින් ගතකරන නමුදු , පන්තියේ අනෙක් ළමයින් මෙන් දුර්වලත්වයක් නොදක්වති. මම ද ඉගනීමෙහි සමත් තුන් හතර දෙනාගෙන් එකෙක් වූයෙමි.

1. සිසුන් සෙල්ලමින් ගතකළේ කුමන දින වලද? (ලකුණු 02)
2. සිසුන් සඳුදා දින පාඩමට දුර්වලත්වයක් පෙන්නුයේ කුමන හේතුවක් නිසාද? (ලකුණු 02)
3. ඉහත ඡේදයට අනුව සඳුදා දින පාඩමට සමර්ථ අය කීදෙනෙක් සිටියේද? ( ලකුණු 02)
4. ඉහත ඡේදයේ එන උක්ත පදයක් හා අනුක්ත පදයක් ලියන්න. (ලකුනු 02)
5. සමත් , දුර්වල යන පද වලට විරුද්ධ පද එක බැගින් ලියා දක්වන්න. (ලකුණු 02)

04. දී ඇති උද්‍ධෘත පාඨ කා විසින් කාහට ප්‍රකාශ කරන ලද්දේදැයි ලියා දක්වන්න. (ලකුණු 10)

1. " ඇයි , ඉතින් , ගැලවෙන විදියක් ඔබම කල්පනා නොකරන්නේ "
2. "මාමා අ⌐වලින් මොකක්ද අදිනවා."
3. "ඇයි මැණියනි , මම කුමන අන්‍යායක් කළෙමිද?"
4. "වැඩි මිල නෑ - ගජලාබයි

   හැඩයි , හැඩයි - තොප්පි "
5. "මං ලොකු වුණාම ටිකට් එකතු කරන කෙනෙක් වෙනවා."

UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

05. පහත වාක්‍ය වල උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳ සැලකිලිමත් වෙමින් හිස්තැන් පුරවන්න. (ලකුණු 10)

1. නුඹලා පාසල් ..............................................
2. ................................................ රැස්වීමට සහභාගී වූහ.
3. සමන් පොත් පාඩම් ..................................................
4. නුඹ පන්සල් ..............................................................
5. ශිෂ්‍යයෝ තම වගකීම් හොඳින් ඉටු .............................

06. නිවැරදි පිළිතුරු තෝරා යා කරන්න. ( ලකුණු 10 )

| (අ) | (ආ) |
|---|---|
| 1. ලූලා නැති වලට කනයා පණ්ඩිතයා | මිශ්‍ර ක්‍රියාවකි |
| 2. නට නටා | අවසානක්‍රියාවකි |
| 3. කරල පැහුණා | සුළු දැනුමක් ඇති තැනැත්තා උඩඟු වීම |
| 4. නටති | වාසියක් සිදුවීම |
| 5. සාගරය | සිඳු |

07. සුදනෝ තම සිරිත්

කළවුන් තමන් ලෙසම සලකත්

..........................................................

..........................................................................

1.ඉහත කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න. ( ලකුණු 02 )

2. ඉහත කවිය රචනා කළ රචකයා හා ග්‍රන්ථය නම් කරන්න. ( ලකුණු 02 )

3. යහපත් ජනයා තමන්ගේ ගුණ අනුගමනය කරන අය සලකන්නේ කෙසේද? ( ලකුණු 02 )

4. යහපත් ජනයා තමන්ගේ ගුණ අනුගමනය කරන අයට සලකන ආකාරය උපමා කර ඇත්තේ කුමකටද? ( ලකුණු 02 )

5. සුදනෝ , සිරිත් යන පද වලට විරුද්ධ පද ලියන්න. ( ලකුණු 02 )

UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION